# 02 ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජය

## හැඳින්වීම

"ප්‍රජාතන්ත්‍රවාදය" (Democracy) පාලන ක්‍රමයක් මෙන් ම ජීවන ක්‍රමයක් ද වේ. නිදහස හා සමානාත්මතාව පදනම් කරගනිමින් සහයෝගයෙන් යුතුව කටයුතු කරන, බහුතර මතයට ගරු කරන, ස්වයං විනයකින් හෙබි, සම්මුතියෙන් තීරණවලට එළඹෙන සමාජයක් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ලෙස හැඳින්විය හැකි ය. එවැනි ජන සමාජයක පැවැත්ම සහතික කිරීම සඳහා පුරවැසියන් තුළ ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග වර්ධනය කිරීම අවශ්‍ය වේ.

පවුලේ, පාසලේ මෙන් ම ජන සමාජයේ ද සාමාජිකයන් වශයෙන් ජීවත් වීමේ දී,

- ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්මට අවශ්‍ය ගුණාංග ගොඩනැඟීම
- ළමා අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ අවබෝධයක් ලබාදීම
- සුබවාදී ලෙස චිත්තවේග හසුරුවා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරදීම
- නායකත්වයේ අවශ්‍යතාව පැහැදිලි කරමින්, නායකත්ව ගුණාංග වැඩි දියුණු කරගැනීම අවධාරණය කිරීම
- අනුගාමිකයකු ලෙස කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීම තුළින් අවශ්‍ය නිපුණතා ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ තහවුරු කිරීම මෙම පරිච්ඡේදයෙන් අපේක්ෂා කෙරේ.

## පවුල හා පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ

### පවුල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ

ඕනෑ ම සමාජයක දැකිය හැකි කුඩා ම, මූලික ම හා වැදගත් ම ඒකකය පවුල යි. පවුලේ ස්වභාවය අනුව න්‍යෂ්ටික පවුල හා විස්තෘත පවුල යනුවෙන් වර්ග දෙකකට බෙදා දැක්විය හැකි බව, 7 වන ශ්‍රේණියේ "අපේ පවුල" ඒකකයේ දී ඔබ අධ්‍යයනය කර ඇත.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ඔබේ පවුල න්‍යෂ්ටික පවුලක් විය හැකි ය. එහෙත් ඔබේ මව, පියා, ආච්චි, සීයා වැනි වැඩිහිටියන්ගෙන් විමසුවහොත් ඔවුන් කුඩා අවධිය ගත කර ඇත්තේ විස්තෘත පවුලක බව පැහැදිලි වනු ඇත. එහෙත් වර්තමානයේ වැඩි වශයෙන් ඔබට දකිය හැක්කේ න්‍යෂ්ටික පවුල් ය.



න්‍යෂ්ටික පවුල - මව, පියා, දූදරුවන්

පවුලේ සෑම සාමාජිකයකුට ම විවිධ කාර්යයන් සහ වගකීම් පැවරී ඇත. ඒවා සුහදව, සාමූහිකව, අවබෝධයෙන් යුතුව ඉටු කිරීමට වගබලා ගැනීම පවුලේ සාමාජිකයන්ගේ යුතුකමකි.



විස්තෘත පවුල - මව, පියා, දූදරුවන්, ආච්චි, සීයා, නැන්දා...

**පවුල තුළ දකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදි ලක්ෂණ**

- ආදරය හා රැකවරණය නොඅඩුව ලැබීම
- සාකච්ඡා මගින් තීරණවලට එළඹීම
- සාමකාමීව ගැටලු නිරාකරණය කර ගැනීම
- සාමූහිකව නිවසේ කටයුතුවලට හවුල් වීම
- සමානාත්මතාවෙන් කටයුතු කිරීම
- අන් මත ඉවසීම හා සවන්දීම
- දෙමාපිය, වැඩිහිටි, නායකත්වයට ගරු කිරීම
- තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටුකිරීම

දරුවන්ට මූලික වශයෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී අත්දැකීම් ලබාගත හැකි වන්නේ පවුල තුළිනි. නායකත්ව ගුණාංග පිළිගැනීම, එකිනෙකාට සවන්දීම, අදහස්වලට ගරු කිරීම, සහයෝගයෙන් කටයුතු කිරීම වැනි ප්‍රජාතන්ත්‍රීය ගුණාංග පවුලේ සාමාජිකයකු ලෙස කටයුතු කිරීමෙන් ඉගෙන ගත හැකි ය.



ප්‍රීතිමත් පවුලක්

පවුල තුළින් දරුවන්ට ලැබෙන සෙනෙහස, ආදරය, කරුණාව, දයාව, රැකවරණය හා පෝෂණය, දරුවන්ගේ යහපැවැත්ම මෙන් ම සමාජයේ යහපැවැත්ම ද තීරණය කරයි. දෙමාපිය වැඩිහිටියන්ගෙන් දරුවන්ටත් දරුවන්ගෙන් දෙමාපිය වැඩිහිටියන්ටත් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් නිසි පරිදි ඉටු කිරීම කාගේත් යහපතට හේතු වේ.



සාමූහිකව කටයුතු කිරීම

"පවුලේ සාමාන්‍ය කටයුතුවල දී" මව, පියා, දරුවන්, වැඩිහිටියන් එක්ව සාකච්ඡා කර තීරණ ගැනීම පවුලේ සමගියට හා දියුණුවට බෙහෙවින් ඉවහල් වේ.

උදා :-

- ආහාර වේල් තෝරාගැනීම සහ සැකසීම
- නිවසේ වැඩකටයුතු සාමූහිකව ඉටු කිරීම
- නිවස පිරිසිදුව තබාගැනීම
- විවේකය ගත කිරීම හා විනෝද වීම
- අධ්‍යාපන කටයුතු සැලසුම් කිරීම

"පවුලේ විශේෂ කටයුතුවල දී" ද සියලුදෙනා එක්ව සාකච්ඡා කර තීරණ ගැනීමෙන් එම කටයුතු වඩා සාර්ථක කරගත හැකි වේ.

උදා :-

- විවිධ උත්සව කටයුතු සංවිධානය
- ඉඩමක්/ නිවසක් මිල දී ගැනීම
- නිවසක් තැනීම, වෙනස් කිරීම, අලුත්වැඩියා කිරීම



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

- වාහනයක් මිල දී ගැනීම
- විවාහ තීරණය කිරීම

පවුලේ කටයුතුවල දී,

- අන් මත ඉවසීම මගින් අන් අයට ගෞරව කිරීමට යොමු වේ.
- අන් මත ගරු කිරීම මගින් බහුතර මතයට ගරු කිරීමට හුරු වේ.
- බහුතර මතයට ගරු කිරීම මගින් පවුල තුළ සුහදතාව, එකමුතුකම වර්ධනය වේ.


නිවසක් තුළ නිදහස් සාමකාමී පරිසරයක් පැවතීම, ඔබේ හැකියා වර්ධනය කරගැනීමට ආධාර වේ. නිවසේ ඇති නිදහස භුක්ති විඳීමේ දී, පවුල තුළ දෙමාපියන්, වැඩිහිටියන් නායකත්වයේ ලා සැලකීම, ඔවුන්ගේ උපදෙස් හා මගපෙන්වීම් ලබා ගැනීම, පවුලේ කටයුතුවලට සහාය වීම හා සහයෝගයෙන් කටයුතු කිරීම දරුවන්ගේ වගකීමකි. එවිට පවුලේ දියුණුව මෙන් ම සමාජයේ දියුණුව ද තහවුරු වනු ඇත.

### 2.1 ක්‍රියාකාරකම

- පවුල තුළ පැවතිය යුතු, ඔබ හඳුනාගත් ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 05ක් නම් කරන්න.
- පවුල තුළ සියලු සාමාජිකයන් සමගියෙන් කටයුතු කරන අවස්ථා කිහිපයක් නම් කරන්න.

## පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ

පවුල හැරුණු විට දරුවකුට සමීපතම ආයතනය වන්නේ පාසලයි. ළමා වියේ සිට යොවුන් විය දක්වා දරුවකු කාලය ගත කරන්නේ පාසල් ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යාවක වශයෙනි. පාසල තුළ පවතින නිදහස, සම්පත් හා අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් තම හැකියා, දක්ෂතා දියුණු කරගැනීමට සෑම ශිෂ්‍යයකුට ම හැකියාව ලැබේ. එමගින් සාර්ථකව ජීවන අරමුණක් කරා ළඟා වීමේ හැකියාව උදා වේ. සෑම ශිෂ්‍යයකු ම උත්සාහ කළ යුත්තේ තමාට සහ සමාජයට වඩාත් ප්‍රයෝජනවත් ජීවන අරමුණු, ඉලක්ක කරා ළඟා වීමටයි. ප්‍රජාතන්ත්‍රවාදී සමාජ තුළ පාසලක දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ බොහොමයකි.




පාසලට ඇතුළත් වන සෑම දරුවකුට ම නිදහසේ අධ්‍යාපනය ලැබීමට සමාන අවස්ථා බොහොමයක් හිමිවීම අප ලද භාග්‍යයකි. ප්‍රාථමික අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා අපට හිමි වී තිබෙන මේ අගනා අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට ඔබ උත්සාහවන්ත විය යුතු ය.

විවිධ පවුල් පරිසරයන්ගෙන් පැමිණෙන දරුවන්ගෙන් සමන්විත පාසල ඒ සියලු දෙනාට ම සමාන අධ්‍යාපන අවස්ථා ලබාදීමට කටයුතු කරයි. එසේ ම පාසල් වේලාව තුළ දරුවන්ට ආරක්ෂාව සැපයීමත්, දරුවන්ගේ විවිධ දක්ෂතා දියුණු කර ගැනීමට ඉඩ ප්‍රස්තා සංවිධානය කර දීමත් පාසලෙන් සිදු වේ. පාසල තුළ පවතින විනය නීති කාටත් පොදු ය. පාසල් පෙළපොත්, නිල ඇඳුම්, දිවා ආහාර, පුස්තකාල හා විද්‍යාගාර පහසුකම් සම සේ ලබාදීමට කටයුතු කෙරේ. විෂය සමගාමී මෙන් ම විෂය බාහිර ක්‍රියාකාරකම්වල යෙදීමට අවස්ථාව සලසා දීමෙන් දරුවන්ගේ විවිධ කුසලතා වැඩි දියුණු කරගැනීමට අවස්ථාවක් සලසා ඇත.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

**ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක් හුරු කිරීම සඳහා පාසල ක්‍රියාත්මක කරන විෂය සමගාමී ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.**

- සාහිත්‍ය සමිති, ආගමික සමිති, ක්‍රීඩා සමිති, විෂයානුබද්ධ සමිති පැවැත්වීම
- ජාතික උත්සව, ආගමික උත්සව, ක්‍රීඩා උත්සව, සංස්කෘතික උත්සව සංවිධානය
- ශිෂ්‍යනායක, පන්ති නායක, විෂය නායක, ක්‍රීඩා නායක වශයෙන් වගකීම් පැවරීම
- නර්තනය, ගායනය, වාදනය, චිත්‍ර ඇඳීම, සාමාන්‍ය දැනීම, රචනා, විවාද වැනි තරග සංවිධානය කිරීම හා පැවැත්වීම
- ශිෂ්‍යභට, පරිසරභට, බාලදක්ෂ, ප්‍රථමාධාර සේවා පුහුණුවීම් හා අත්දැකීම් ලබාදීම
- අධ්‍යාපන චාරිකා, ක්ෂේත්‍ර චාරිකා, ගවේෂණ චාරිකා, විනෝද චාරිකා සංවිධානය කිරීම

### 2.2 ක්‍රියාකාරකම

- ඔබේ පාසල තුළ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් කිහිපයක් නම් කරන්න.
- එම ක්‍රියාකාරකම්වලට සහභාගි වීමෙන් ඔබට ලබාගත හැකි ප්‍රයෝජන 05ක් ලියන්න.

## ළමා අයිතිවාසිකම් හා යුතුකම් (Children's Rights and Responsibilities)

මව්පියන්ට තම වටිනා ම වස්තුව දරුවන් වන අතර රටක අනාගත සම්පත ද දරුවෝ වෙති. සෑම ආගමික ශාස්තෘවරයකු ම තම දේශනාවල දී දරුවන්ට ප්‍රමුඛතාවක් ලබාදෙමින්, ඔවුන්ගේ වැදගත්කම පිළිබඳ කරුණු අවධාරණය කර ඇත. සෑම සමාජයක් ම දරුවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි.

දරුවන්ට නිසි පෝෂණය ලබාදීම, මනා ලෙස රැකබලා ගැනීම, උචිත අධ්‍යාපනයක් ලබාදීම, කායික හා මානසික වර්ධනයට පසුබිම සැකසීම, මනා පෞරුෂයකින් යුතු පුද්ගලයකු බවට පත්වීම සඳහා සහායවීම හා මගපෙන්වීම, වැඩිහිටියන්ගේ මෙන් ම රජයේ ද වගකීමකි. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව වයස අවුරුදු 18 සම්පූර්ණ නොකළ පුද්ගලයෝ, ළමයින් ලෙස පිළිගැනෙති. ස්ත්‍රී, පුරුෂ භේදයකින් තොරව සෑම ළමයකුට ම හිමි වන අයිතිවාසිකම්, ළමා අයිතිවාසිකම් ලෙස හැඳින්වේ. මෙම අයිතිවාසිකම් ප්‍රධාන තේමා හතරක් යටතේ දක්වා ඇත.

- පැවැත්මට ඇති අයිතිය (Right to Survival)
- ආරක්ෂාවට ඇති අයිතිය (Right to Protection)
- සහභාගිත්වයට ඇති අයිතිය (Right to Participation)
- සංවර්ධනයට ඇති අයිතිය (Right to Development)

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය, පූර්විකාවකින් හා වගන්ති 54කින් සමන්විත වන අතර එය ආරක්ෂා කිරීමට හා අනුගමනය කිරීමට සෑම සාමාජික රාජ්‍යයක් ම බැඳී සිටී. එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල (යුනිසෙෆ්), ළමා අයිතිවාසිකම් සුරැකීමට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ආයතනයකි.

ළමයින් තම අයිතිවාසිකම් භුක්ති විඳින සෑම අවස්ථාවක ම තම යුතුකම් ඉටු කිරීමට ද වගබලා ගත යුතු ය. අයිතිවාසිකම් හා යුතුකම් එකිනෙකට බැඳී පවතී. පොදුවේ සමාජයේ යහපැවැත්ම සඳහා අයිතිවාසිකම් භුක්තිවිඳීම මෙන් ම යුතුකම් ඉටු කිරීම ද අනිවාර්ය වේ. යුතුකම්වලින් තොර අයිතිවාසිකම් අර්ථ විරහිත ය; ආත්මාර්ථකාමී ය.

ළමා අයිතිවාසිකම් හා යුතුකම් කිහිපයක් පහත දැක්වේ. ඒවා හොඳින් අධ්‍යයනය කරන්න.

| ළමා අයිතිවාසිකම් | ළමා යුතුකම් |
|---|---|
| • අධ්‍යාපනය ලැබීම | • හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරතවීම<br>• ගුරු දෙගුරුන්ට ගෞරව කිරීම<br>• පාසලේ විනය, නීතිරීති හා සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම |
| • සෞඛ්‍යපහ සුකම් ලබාගැනීම | • පෞද්ගලික සෞඛ්‍ය පිළිබඳ දැනුම්වත්වීම<br>• යහපත් සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කිරීම<br>• සෞඛ්‍ය පුරුදු පිළිබඳ අන් අය දැනුම්වත් කිරීම |
| • සමාජසුරක ්ෂිතතාවෙන් ප්‍රතිලාභ ලබාගැනීම | • සමාජ සුරක්ෂිතතාව වෙනුවෙන් දායක වීම<br>• සමාජ සුරක්ෂිතතාව පිළිබඳ අන් අය දැනුම්වත් කිරීම |
| • ආගමිකවි ශ්වාසයක් දැරීමේ නිදහස | • ආගමානුකූල හා යහපත් දිවිපැවැත්ම<br>• අන් අයගේ ආගමික විශ්වාසයන්ට ගරු කිරීම |
| • නිදහස්අදහ ස්ප්‍රක ාශ කිරීම | • සත්‍ය කරුණු ප්‍රකාශ කිරීම<br>• අන් අයට හානියක් සිදු නොවන අදහස් ප්‍රකාශ කිරීම |
| • මිතුරුසබ ඳතා පැවැත්වීම | • නැණවත්ව මිතුරන් තෝරා ගැනීම<br>• වයසට ගැළපෙන මිතුරන් ඇසුරු කිරීම<br>• සොරකම්, වංචා හා හිංසාකාරී ක්‍රියාවන්ගෙන් වැළකීම |
| • සමිතිසමාග ම් කටයුතු වලට සම්බන්ධ වීම | • තම හැකියාවන් වර්ධනය කර ගැනීම<br>• සමාජ සංවර්ධනයට සහාය වීම |
| • නිසි රැකවරණය ලැබීම | • මව්පිය, වැඩිහිටියන්ට ගරු කිරීම හා අවනතවීම<br>• හැකි සෑම විට ම ඔවුන්ට සහාය වීම |

## ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ක්‍රියාත්මක වන ආයතන

වර්තමාන සමාජය තුළ ළමයින්ට විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වීමේ සිද්ධි ජනමාධ්‍ය තුළින් නිරන්තරයෙන් අසන්නට ලැබේ. විවිධ අපචාර ක්‍රියාවල යොදවා ගැනීම, හිංසා කිරීම, ලිංගික අතවර සිදු කිරීම, ශ්‍රමිකයන් ලෙස යොදවාගැනීම ඉන් කිහිපයකි.

දරුවන්ට සමාන අවස්ථා අහිමි වීමටත් විවිධ පීඩාවන්ට ගොදුරු වීමටත් බලපාන කරුණු රාශියකි. ඒ අතරින් මව්පියන් වෙන්වීම, මියයාම, විදේශගතවීම, සිරගතවීම, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, දරුවන් කෙරෙහි දක්වන අවධානය හා සැලකිල්ල අඩු මට්ටමක පැවතීම, දරිද්‍රතාව වැනි කරුණු ප්‍රමුඛ වේ.

මේ තත්ත්වයන්ගෙන් දරුවන් මුදවා ගැනීමටත් ඔවුනට අවශ්‍ය සහාය හා මගපෙන්වීම් ලබාදීමටත් ළමා අයිතිවාසිකම් ආරක්ෂාකර දීමටත් ක්‍රියාත්මක වන ආයතන කිහිපයක නම් පහත දැක්වේ.

- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
- ළමා හා කාන්තා කාර්යාංශය, ශ්‍රී ලංකා පොලිසිය

**ප්‍රාදේශීය මට්ටමින් දරුවන් හා පවුල් සඳහා සේවා සපයන රාජ්‍ය නිලධාරීන්**

| තනතුර | කාර්යාලය | සපයනු ලබන සේවා |
|---|---|---|
| ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දරුවන්ගේ අයිතීන් හා අදාළ සියලු සේවාවන් හා සම්බන්ධීකරණ සහායන් ලබාදීම |
| ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධ ගැටලු විමර්ශනය හා සහාය ලබාදීම |
| මුල් ළමාවිය සංවර්ධන නිලධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | පෙර පාසල් අධ්‍යාපනය හා අනෙකුත් මුල් ළමාවිය සඳහා අදාළ සේවාවන් ලබාදීම |
| ළමා හා වනිතා කටයුතු අමාත්‍යාංශයේ උපදේශන නිලධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ළමයින් හා කාන්තාවන් සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් ලබාදීම |
| සමාජ සේවා නිලධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දරුවන්ට ද අදාළ වන පරිදි රජයේ විශේෂ සමාජ ශුභසාධන සේවා සැපයීම |

| තනතුර | කාර්යාලය | සපයනු ලබන සේවා |
| --- | --- | --- |
| කාන්තා සංවර්ධන නිලධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | කාන්තාවන් හා ගැහැනු දරුවන් සඳහා අවශ්‍ය ගෘහ ආර්ථික හා වෘත්තීය අධ්‍යාපන සේවාවන් ලබාදීම |
| නොවිධිමත් අධ්‍යාපනය හා විධිමත් අධ්‍යාපනය පිළිබඳ නිලධාරි | කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කලාප අධ්‍යාපන කාර්යාලය | පාසල් නොයන දරුවන් හා විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා පවතින දරුවන් සඳහා අවශ්‍ය සේවාවන් ලබාදීම |

## 2.3 ක්‍රියාකාරකම

- ළමා අයිතිවාසිකම් හා යුතුකම් මැයෙන් ප්‍රදර්ශන පුවරුවක් නිර්මාණය කර ප්‍රදර්ශනය කරන්න. ඒ සඳහා රචනා, කෙටිකතා, නිසඳැස්, චිත්‍ර, කාටූන් වැනි නිර්මාණ ඇතුළත් කරන්න.

## විවිධ චිත්තවේග (Different emotions)

අපේ සිත් තුළ ඇති වන විවිධ සිතුවිලිවල ස්වභාවය මුහුණේ ඉරියව්වලින් පැහැදිලි වේ. සතුට, කෝපය, භය, දුක වැනි හැඟීම් ඇති වූ අවස්ථාවල ඔබගේ මෙන් ම අන් අයගේ ද මුහුණෙන් ඇති වන වෙනස්කම් සිහිපත් කරන්න. සිනාසීම, හැඬීම, කෝපයට පත්වීම, නිහඬවීම, තැතිගැන්ම, කලකිරීම, උදාසීන බව ඉන් කිහිපයකි.

යහපත් චිත්තවේග තමන්ට මෙන් ම සමාජයට ද ප්‍රියජනක ය. එහෙත් අයහපත් චිත්තවේග සුබවාදීව හසුරුවා නොගතහොත්, තමන්ට ද සමාජයට ද හානි සිදු වේ. නිදසුනක් ලෙස අධික කෝපයට පත් වූ පුද්ගලයකු අන් අයට බැණ වැදීම, පහර දීම, දේපළ විනාශ කර දැමීම, ජීවිත හානි සිදු කිරීම වැනි ක්‍රියාවලට පෙළඹිය හැකි ය.

දිනපතා ප්‍රවෘත්ති අතර චිත්තවේග පාලනය කරගත නොහැකිව සිදු කළ විවිධ සිදුවීම් අසන්නට, දකින්නට ලැබේ. ගුරුතුමා/ගුරුතුමිය සමග මේ පිළිබඳ සාකච්ඡා කරන්න. ඔහු/ඇය ඔබට බොහෝ කරුණු පැහැදිලි කර දෙනු ඇත.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## චිත්තවේග හා ඒ අනුව ඇති වන ප්‍රතික්‍රියා

| චිත්තවේගය | | ප්‍රතික්‍රියාව |
|---|---|---|
| සතුට | ⟶ | සිනාසීම, නැටීම, ඔල්වරසන් දීම, සතුටු කඳුළු සැලීම, කෑගැසීම, උඩ පැනීම |
| දුක | ⟶ | හැඬීම, සුසුම් හෙළීම, විලාප දීම, මුහුණ මළානික වීම, පපුවට ගසාගැනීම, ඇස් රතුවීම |
| කෝපය | ⟶ | බැණ වැදීම, පහරදීම, දෙතොල් අතපය වෙව්ලීම, වචන පැටලීම, දත්මිටි කෑම, නිහඬ වීම |
| බිය | ⟶ | ශරීරය වෙව්ලීම, කෑගැසීම, ඇස් විශාල වීම, දිවීම, කතා කිරීමට අපහසු වීම, ගොතගැසීම |



ඉහත දක්වා ඇත්තේ, චිත්තවේගවලට ශරීරය බාහිරව දක්වන ප්‍රතික්‍රියා ය. චිත්තවේගවල ප්‍රතිඵල ලෙස ශරීරය අභ්‍යන්තරයේ ද රුධිර සංසරණය වේගවත්වීම හා හෝමෝන ශ්‍රාවයවීම වැනි ප්‍රතික්‍රියා සිදු වේ.

අයහපත් චිත්තවේග තත්ත්වයන් දිගින් දිගට ම පැවතීම නිසා පුද්ගලයා කායික, මානසික සහ සමාජීය වශයෙන් පිරිහීමට ලක් වේ.

උදා :- කායික රෝග/ මානසික රෝග/ විවිධ ගැටුම් ඇති කර ගැනීම/ සිරගතවීම/ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම/ සියදිවි නසාගැනීම

## චිත්තවේග සුබවාදීව හසුරුවා ගනිමු

ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක සියලු පුරවැසියන්ට සමාන අවස්ථා හිමි විය යුතු ය. එහෙත් විවිධ හේතු කාරණා මුල් කරගෙන අසමානතා ඇති වන අවස්ථා දක්නට ලැබේ. ජීවිතයේ විවිධ අවස්ථාවල අප මුහුණපාන අත්දැකීම්වල ස්වභාවය අනුව විවිධ හැඟීම් ඇති වේ. එබඳු අවස්ථාවල දක්වනු ලබන ප්‍රතිචාර, අවස්ථාවට සුදුසු හා ගැළපෙන ඒවා විය යුතු ය. දෛනික ජීවිතයේ දී විවිධ අවස්ථාවල මතු වන හැඟීම් හෙවත් චිත්තවේග,

● හඳුනා ගැනීමට

● පාලනය කරගැනීමට

● උචිත ලෙස ප්‍රකාශ කිරීමට අප පුරුදු පුහුණු විය යුතු ය.

## අයහපත් චිත්තවේග සමනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග



● **මනස සන්සුන් කිරීමේ අභ්‍යාස**

- භාවනා කිරීම
- මල් වැවීම
- පරිසරය රසවිඳීම
- ආගමික කටයුතුවල යෙදීම
- සුරතල් සතුන් ඇති කිරීම

● **මිතුරන් ඇසුරු කිරීම**



- සාකච්ඡා කිරීම
- එකිනෙකාට සහායවීම
- විවිධ ක්‍රියාකාරකම්වල නිරතවීම
- චාරිකා යාම

● **අයහපත් චිත්තවේග හටගන්නා පුද්ගල හා පරිසර තත්ත්වයන් වෙනස් කිරීම**

- නිවස, කාර්යාලය පිරිසිදුව හා පිළිවෙළකට තබාගැනීම
- අසමානතා, වෙනස්කම් අඩු කරගැනීම
- පරිසරය අලංකාර කරගැනීම
- මිත්‍රශීලීව හා සහයෝගයෙන් කටයුතු කිරීම
- කාල සටහනකට අනුව වැඩ කිරීම



● **නිර්මාණකරණය සඳහා යොමු වීම**



- කවි, ගීත රචනා කිරීම, පොත්පත් ලිවීම
- නාට්‍ය නිර්මාණය කිරීම, උද්‍යාන අලංකරණය
- සෞන්දර්ය ක්‍රියාකාරකම්වල නිරතවීම
- ගීත ගායනය, නර්තනය, චිත්‍ර ඇඳීම
- නාට්‍ය, චිත්‍රපට නැරඹීම



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

● ක්‍රීඩා කටයුතුවල හා ශාරීරික ව්‍යායාම්වල යෙදීම



- ගෘහස්ථ හෝ බාහිර හෝ ක්‍රීඩාවක යෙදීම
- ඇවිදීම
- ශාරීරික ව්‍යායාම්වල යෙදීම
- පිහිනීම

## චිත්තවේග සුබවාදීව හසුරුවාගෙන ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරමු

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු වශයෙන් චිත්තවේග සුබවාදීව හසුරුවා ගැනීම, පුද්ගල ජීවිතයට මෙන් ම තමන්ගේ යහපතට ද හේතු වේ.

විවිධ හේතු පදනම් කරගෙන අප තුළ මානසික පීඩා හා චිත්තවේග, ඇතිවීම ස්වාභාවික ය. ඒවා ඵලදායීව හසුරුවා ගැනීමට අප පුරුදු පුහුණු විය යුතු ය. ඒ සඳහා,

- පෙර සූදානම
- කාල සටහනකට වැඩ කිරීම
- අන් අයගේ උදවු හා උපදෙස් ලබාගැනීම
- සවන්දීම
- නීතිරීති හා සිරිත්විරිත් පිළිපැදීම
- තමා පිළිබඳ විශ්වාසයක් ඇති කරගැනීම වැනි ක්‍රම ශිල්ප භාවිත කළ හැකි ය.

එමගින් විවිධ පීඩාවන්ට පත් නොවී, ජීවන අරමුණු කරා පහසුවෙන් ළඟා විය හැකි ය.

නිදහස හා සමානාත්මතාව අගයන හා අන් අයගේ අයිතිවාසිකම් සුරකින, තම යුතුකම් ඉටු කරන ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු වීමට ඔබ ම අදිටන් කරගත යුතු ය. ඒ සඳහා ඔබේ යහළු යෙහෙළියන්ට ද ඔබගේ සහයෝගය ලබාදිය යුතු ය. එවිට ඔබ,

- ආවේගවලට ලක් නොවන සමබර පෞරුෂයකින් හෙබි පුද්ගලයකු බවට පත් වේ.
- සැහැල්ලු ගති පැවතුම්, සිනා මුසු ප්‍රියමනාප ඉරියව්, සිත් ඇදගන්නා කතාබහ, ඔබ තුළ නිරායාසයෙන් ඇති වේ.
- අන් අයගේ සිත් නොරිදවන පුද්ගලයකු බවට පත් වේ.
- අන් අය සමග සහයෝගයෙන් හා සාමකාමීව කටයුතු කරයි.
- විශ්වාසයට හා ගෞරවයට පාත්‍ර වෙයි.

## 2.4 ක්‍රියාකාරකම

- චිත්තවේග සුබවාදීව හැසිරවීම නිසා හා චිත්තවේග පාලනයෙන් තොරව ක්‍රියාවට නැගීම නිසා ඇති වූ යහපත් හා අයහපත් ප්‍රතිඵල පිළිබඳ තොරතුරු රැස් කරන්න.
- රැස් කරගත් තොරතුරු ඇසුරින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු ලෙස චිත්තවේග සුබවාදීව හසුරුවාගැනීමේ වැදගත්කම පිළිබඳ අර්ථවත් වාක්‍ය 05ක් ලියන්න. නැත්නම් කවියක්, ගීතයක් හෝ චිත්‍රයක් නිර්මාණය කරන්න. හොඳ ම නිර්මාණ පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

### නායකත්වයේ අවශ්‍යතාව හඳුනා ගනිමින් නායකත්ව ගුණාංග ප්‍රගුණ කරමු

මිනිසා සාමූහිකව කටයුතු කරන සෑම අවස්ථාවක ම, ඔහු මෙහෙයවීම සඳහා නායකයකු අවශ්‍ය වේ. පුද්ගලයන් කිහිපදෙනෙකු හෝ සමූහයක් පොදු අරමුණක් හෝ අරමුණු කිහිපයක් ඉටු කර ගැනීම සඳහා මෙහෙයවීම හා පෙළඹවීම, නායකයාගේ කාර්යය යි.

- නායකත්වය (Leadership) යනු ජනතාවගේ පැහැදිලි අරමුණක් ඉටු කරගැනීම සඳහා ඔවුන් යොමු කිරීම හා නම්මවා ගැනීමේ ක්‍රියාවලියකි.
- ආයතනයක හෝ සංවිධානයක පරමාර්ථ සපුරා ගැනීම සඳහා අන්‍යයන් පෙළඹවීමට, ඔවුන්, ඒ සඳහා කැපවීමට, උනන්දු කරවීමට ඇති හැකියාව නායකත්වය යි.
- නායකත්වය වනාහි ක්‍රමවේදයක් හෝ තාක්ෂණික ක්‍රම ශිල්පයක් නොවේ. එය හදවත විවෘත කරගැනීම පිළිබඳ කාරණයකි. ඉන් තමාව මෙන් ම අන්‍යයන් ද උත්තේජනය කළ හැකි ය.
- "ශ්‍රේෂ්ඨ නායකත්වය" යනු අනුගමනය කළ හැකි ක්‍රමවේදයක් නොවේ. එය මානුෂික වූ අත්දැකීමක් වන අතර, හදවත තුළින් මතුව එන සෙසු හදවත් හා බැඳෙන මානුෂික ක්‍රියාකාරකමකි.

### සමාජය තුළ නායකත්ව ලක්ෂණ දැකිය හැකි අවස්ථා

- පවුල තුළ - දෙමාපියන්, වැඩිහිටි දරුවන්
- පාසල තුළ - විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, සහකාර විදුහල්පති, අංශ ප්‍රධානීන්, පන්ති භාර ගුරුතුමා, ශිෂ්‍ය නායකයන්, කළමනාකරණ කමිටු නායකයන්, පන්ති නායකයන්, විෂය නායකයන්
- සමාජය තුළ - ආගමික නායකයන්, ප්‍රජා නායකයන්, දේශපාලන නායකයන්, ආයතන ප්‍රධානීන්

## නායකයකු සතු විය යුතු ගුණාංග

- සන්නිවේදන හැකියාව → ඉදිරිපත් කිරීම, පැහැදිලි කිරීම, කථනය, අනුපිළිවෙළ ගොඩනැගීම, සවන් දීම, ස්ථිරසාර බව
- ගැටලු විසඳීමේ හැකියාව → ගැටලු නිවැරදිව තේරුම් ගැනීම, තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, විසඳුම් සෙවීම, ක්‍රියාත්මක කිරීම
- සැලසුම් කිරීමේ හැකියාව → අරමුණු තීරණය කිරීම, සැලසුම් කිරීම, සංවිධානය කිරීම, තීරණ ගැනීම
- මෙහෙයවීමේ හැකියාව → ඉලක්ක තීරණය කිරීම, කණ්ඩායම් හැසිරවීම, පාලනය කිරීම, ඉලක්ක කරා ළඟාවීම
- මානව සම්බන්ධතා → සමාජශීලී බව, ආකර්ෂණීය බව, අන්‍යොන්‍ය සම්බන්ධතා පවත්වා ගැනීමේ හැකියාව, තේරුම්ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම
- ආවේදනීය හැකියාව → මිත්‍රශීලී බව, සුහද බව, සංවේදී බව, ප්‍රබෝධවත් බව

## සමාජය තුළ දැකිය හැකි විවිධ නායකත්ව ශෛලීන් හඳුනා ගනිමු

සමාජයට නායකත්වය සපයන පුද්ගලයන්ගේ ස්වභාවය හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් අනුව එම නායකයන් දරන නායකත්ව ශෛලීන් විවිධ වේ. පවුලක් තුළ, ආයතනයක, සංවිධානයක, හෝ රටක නායකයන් දෙස විමර්ශනාත්මකව බැලීමේ දී ඔවුන් අතර පවතින වෙනස්කම් රැසක් හඳුනාගත හැකි ය. එහි දී ඔබ උත්සාහ කළ යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු වීමට හා අපේක්ෂිත ප්‍රජාතන්ත්‍රවාදී සමාජය තහවුරු කිරීමටයි.

| ඒකාධිපති නායකත්ව ශෛලිය | දූෂිත නායකත්ව ශෛලිය |
|---|---|
| - පොදු ජනතා අදහස් නොපිළිගැනීම | -පොදු දේපළ අයුතු ලෙස පරිහරණය කිරීම |
| - වෙනස් වීමට කැමති නොවීම | -සොරකම්, වංචා හා දූෂණ කටයුතුවල නියැලීම |
| - ඉතා දැඩිව ක්‍රියා කිරීම | -වැරදි පූර්වාදර්ශ ප්‍රදර්ශනය කිරීම |
| - ඒකමතිකව තීරණගැනීම | -නීතිරීති, සිරිත්විරිත්, සම්ප්‍රදායන්ට ගරු නොකිරීම |
| - තර්ජනය කිරීම, බියගැන්වීම | -පෞද්ගලිකත්වයට වැඩි නැඹුරුවක් දැක්වීම |
| - දක්ෂතා වර්ධනයට ඉඩක් නොදීම | |

| නාමික නායකත්ව ශෛලිය | ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය |
|---|---|
| - ජනතා ශුභසිද්ධියට කටයුතු නොකිරීම<br>- යහපත් නායකත්ව ගුණාංගවලින් තොර වීම<br>- පැහැදිලි අරමුණු, ඉලක්ක නොතිබීම<br>- වෙනස්කම් සිදු නොකිරීම<br>- තමා කැපී පෙනීමට උත්සාහ දැරීම | - ජනතා අදහස් පිළිගැනීම හා ගරු කිරීම<br>- ජනතාව සමග ඉතා සමීපව කටයුතු කිරීම<br>- ජනතාව උද්යෝගිමත් කිරීම හා උනන්දු කිරීම<br>- ප්‍රශ්නවලට සවන්දීම හා ප්‍රශ්න විසඳීම<br>- ජනතාවගේ දක්ෂතා වර්ධනයට ඉඩ සැලසීම<br>- නිදහස, සමානාත්මතාව අගය කිරීම හා තහවුරු කිරීම |

### සමාජයට නායකයන් අවශ්‍ය වන්නේ ඇයි ?

යම් ජන සමාජයක අපේක්ෂා, අරමුණු, පරමාර්ථ ඉටු කරගැනීම සඳහා එය මෙහෙයවීමට නායකත්වය අවශ්‍ය වේ. නිවැරදි කාර්යශූර නායකත්වයක් නොමැති විට පවුල, පාසල, ආයතනය, සංවිධාන මෙන් ම රාජ්‍යය ද පරිහානියට පත් වේ. මේ සම්බන්ධ උදාහරණ ගුරුතුමා/ ගුරුතුමිය සමග සාකච්ඡා කරන්න.

නායකයකු වීමට හේතු බොහොමයකි. ඉන් කිහිපයක් පහත දැක්වේ.

- නිවැරදි දර්ශනයක් සහිතව සංවිධාන, ආයතන හා රාජ්‍ය ගොඩනැගීමට
- ඉලක්ක නිර්මාණය කිරීමට හා ඉලක්ක කරා මෙහෙයවීමට
- නියමිත පරිදි සැලසුම් කිරීමට
- අභියෝග, විරෝධතා භාරගැනීමට
- අභියෝග, විරෝධතා ප්‍රජාතන්ත්‍රීයව පාලනය කිරීමට
- අනුගාමිකයන් ඇද බැඳ තබා ගැනීමට
- අනුගාමිකයන් උනන්දු කරවීමට
- සම්පත් නිසි ලෙස බෙදාදීමට හා පරිහරණයට
- ගැටලු විසඳා දීමට හා අවම කිරීමට

## 2.5 ක්‍රියාකාරකම

- ඔබේ සිත් ගත් ආගමික, දේශපාලන, ප්‍රජා නායකයන් පිළිබඳ තොරතුරු හා ඡායාරූප එක්රැස් කරන්න.
- ප්‍රජාතන්ත්‍රීය සමාජය තහවුරු කිරීම හා ශක්තිමත් කිරීම සඳහා එම නායකයන් ඉටු කළ මෙහෙය පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කරන්න.

### ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ගුණාංග

අද ලොව බොහෝ රටවල ක්‍රියාත්මක වන පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයයි. ඇමෙරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, බ්‍රිතාන්‍යය, ස්විට්සර්ලන්තය, ඉන්දියාව, ශ්‍රී ලංකාව වැනි රටවල් ඊට උදාහරණ වේ. මේ රටවල දේශපාලන නායකත්වය තෝරා ගැනීමේ ක්‍රමවේදය වන්නේ මැතිවරණ පැවැත්වීමයි. මැතිවරණවල දී ජනතාව විසින් තමන් කැමති නායකයෝ මහජන නියෝජිතයන් ලෙස තෝරා පත් කරගනු ලැබෙති. දේශපාලන නායකත්වයේ ආදර්ශ රටක සෑම අංශයක් කෙරෙහි ම සෘජුව බලපෑම් ඇති කරයි. ඔවුන් සපයන පූර්වාදර්ශ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක යහපැවැත්ම තීරණය කරයි.

### ප්‍රජාතන්ත්‍රවාදී නායකයකු සතු විය යුතු ගුණාංග කිහිපයක්

- මානව හිතවාදී බව
- අවංකකම
- කැපවීම
- සමානාත්මතාව
- මිත්‍රශීලී බව
- නිර්මාණශීලී බව
- නිවැරදි තීරණ ගැනීම
- ආත්ම විශ්වාසය
- ස්ථිරසාර බව
- සවන්දීම
- පක්ෂග්‍රාහී නොවීම
- සමාජශීලී බව
- දූරදක්නා නුවණ
- අන් අයට උදවු කිරීම

### නායකයා හා අනුගාමිකයා

- නායකයා (Leader) කණ්ඩායම මෙහෙයවන්නා ය.
- අනුගාමිකයා (Follower) යනු නායකත්වයට අනුව කටයුතු කරන්නා ය.
- නායකයා කණ්ඩායම මෙහෙයවන විට අනුගාමිකයා විශ්වාසයකින් යුතුව කටයුතු කිරීමට සූදානම් විය යුතු ය.
- නායකයාට නිවැරදි අරමුණක් කරා ගමන් කිරීමට සහායවීම හා ලාභ අපේක්ෂාවෙන් තොරව කටයුතු කිරීම අනුගාමිකයාගේ යුතුකමකි.
- විශිෂ්ට නායකයකු බවට පත්වීමට අනුගාමිකයකු ලෙස කැපවීම හා උනන්දුව ඉවහල් වේ.
- නායකයා හා අනුගාමිකයා අන්‍යෝන්‍ය වගකීමෙන් බැඳී ඇත.

### නායකත්වය හා අනුගාමිකත්වය සමාජය තුළ දැකිය හැකි අවස්ථා

පවුල, පාසල හා සමාජය, නායකයන්ගෙන් හා අනුගාමිකයන්ගෙන් සමන්විත කණ්ඩායම් රැසකින් නිර්මාණය වී තිබේ. නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

| නායකයා | | අනුගාමිකයා |
|---|---|---|
| පියා | - | පවුලේ සෙසු සාමාජිකයන් |
| විදුහල්පති | - | ගුරු මණ්ඩලය, සිසු දරු දැරියන් |
| විහාරාධිපති | - | සෙසු ස්වාමීන් වහන්සේලා, දායක දායිකාවන් |
| මන්ත්‍රීවරයා | - | ඡන්ද දායකයන් |
| ජනාධිපතිවරයා | - | රටවැසියන් |

තවත් නිදසුනක් ලෙස පාසලක් සලකා බැලූ විට විවිධ නායකයන් හා අනුගාමිකයන් රැසක් දැකිය හැකි ය. විවිධ නායකයන් තව අවස්ථාවක අනුගාමිකයන් විය හැකි ය. අවස්ථානුකූලව තම වගකීම් හා යුතුකම් නිසි පරිදි ඉටු කිරීම නායකයන්ගේ මෙන් ම අනුගාමිකයන්ගේ කාර්යය යි. පහත නිදසුන් බලන්න.

| නායකයා | | අනුගාමිකයා |
|---|---|---|
| විදුහල්පති | - | ගුරු මණ්ඩලය, සිසු දරු දැරියන් |
| පන්තිභාර ගුරුවරයා | - | පන්තියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් |
| ශිෂ්‍ය නායකයා | - | පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් |
| පන්ති නායකයා | - | පන්තියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් |
| විෂය නායකයා | - | විෂය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් |

## ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්ම

වර්තමාන සමාජයේ පුද්ගලයන් අතර විවිධ ගැටුම්, මතභේද ඇති වී තිබෙනු දැකිය හැකි ය. ඊට හේතුව වන්නේ එකිනෙකා අතර ඇති වී තිබෙන තරගය හා අවිශ්වාසයයි. කිසිවකුට සමාජයේ තනිව ජීවත්වීම අපහසු ය. සමූහයක් ලෙස කටයුතු කිරීමේ දී අන් අයට ගරු කරමින්, අන් මත ඉවසමින්, සාධාරණව කටයුතු කළ යුතු ය. එවිට ගැටුම් හා මතභේද අවම වේ.

සම්මත සිරිත්විරිත්, නිතිරීති හා සම්ප්‍රදායන්ට ගරු කරමින්, සමානාත්මතාවෙන් හා සහජීවනයෙන් යුතුව කටයුතු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක දී දැකිය හැකි ය. මෙබඳු සමාජයක විශේෂ ලක්ෂණය වන්නේ තම යහපත පමණක් නොව අන් අයගේ යහපත පිළිබඳව ද උනන්දු වීමයි.

ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්ම යනු ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග තම ජීවන පුරුදු බවට පත් කර ගෙන සමාජය තුළ යහපත් පුරවැසියකු ලෙස කටයුතු කිරීමයි.

ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්මට අදාළ ගුණාංග

- අන් අයගේ මතයට ගරු කිරීම
- සහයෝගයෙන් කටයුතු කිරීම
- අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීම
- සාකච්ඡා මගින් තීරණවලට එළඹීම
- ස්වයං විනයකින් යුතුව කටයුතු කිරීම
- සමානාත්මතාවට ගරු කිරීම
- විනිවිද භාවයකින් කටයුතු කිරීම
- අවංකව හා නීතිගරුකව කටයුතු කිරීම
- අන් අයගේ අයිතිවාසිකම්වලට ගරු කිරීම
- විවිධ මත ඉවසීම

## ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාව සමාජයේ යහපැවැත්ම සහතික කරයි

පාලන ක්‍රමයක් මෙන් ම ජීවන ක්‍රමයක් ලෙස ද ප්‍රජාතන්ත්‍රවාදය හඳුන්වා ඇත. එසේ හැඳින්වීමට හේතුව සමාජයේ යහපැවැත්ම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග තහවුරු වීම අත්‍යවශ්‍ය වීමයි. ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාව, සමාජයේ යහපැවැත්මට හේතු වන ආකාරය විමසා බලමු.

- **ජන සමාජය තුළ සුහදතාව වර්ධනය වීම**
    - සෑම ජන කණ්ඩායමක් සඳහා ම එම අවස්ථා ලබාදීම හා ගෞරව කිරීම නිසා සම්බන්ධතා වර්ධනය වීම
    - තම අවශ්‍යතා අපේක්ෂිත මට්ටමින් ඉටු වීම නිසා ජනතාව තෘප්තිමත් වීම
    - සෑම කටයුත්තක දී ම සියලු දෙනාගේ දායකත්වය හා නියෝජනය හිමි වීම

- **ගැටුම් අවම වූ සමාජයක් බිහිවීම**
    - බහුතර මතයට ගරු කිරීම
    - සුළු ජන නියෝජනයට ඉඩ සැලසීම
    - සෑම ජන වර්ගයකට ම මෙන් ම සංස්කෘතියකට ම ගෞරව කිරීම

- **නීතිගරුක ජන සමාජයක් බිහිවීම**
    - පුරවැසියන් නීතිගරුක වීම
    - සාධාරණව, සාමකාමීව කටයුතු කිරීම
    - එකිනෙකා පිළිගැනීම, ගෞරව කිරීම

- **සියලු දෙනාගේ ම අයිතිවාසිකම් ආරක්ෂා වීම**
    - අයිතිවාසිකම් පිළිගනියි
    - යුතුකම් ඉටු කරයි
    - නිදහස අගය කරයි

## 2.6 ක්‍රියාකාරකම

- "ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම සමාජයේ යහපතට හේතු වේ" මැයෙන් රචනයක් ලියන්න. හොඳ ම රචනා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

**සාරාංශය**

- පවුල් ඒකකය තුළ ක්‍රියාත්මක ප්‍රජාත්ත්‍රවාදී ලක්ෂණ පවුලේ යහපැවැත්මට හේතු වේ.
- පවුල් ඒකකයේ සාමාජිකයන් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්මට අදාළ ගුණාංග වර්ධනය කරගැනීම වැදගත් වේ.
- පාසල් සමාජය තුළ ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණවලට අනුගත වෙමින් කටයුතු කළ යුතු ය.
- ළමා අයිතිවාසිකම් නිසි පරිදි භුක්ති විඳීම හා යුතුකම් ඉටු කිරීම වැදගත් වේ.
- ළමා අයිතිවාසිකම් සුරැකීමට ක්‍රියාත්මක වන ආයතන සහ එම ආයතන සතු කාර්යභාර රැසක් ඇත.
- පුද්ගලයා තුළ ඇති වන විවිධ චිත්තවේගී ස්වභාවයන් ඔහුගේ හැසිරීම කෙරෙහි බලපායි.
- ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියන් වශයෙන් තම චිත්තවේග සුබවාදීව හසුරුවා ගැනීම වැදගත් වේ.
- ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ගුණාංග හඳුනාගෙන ඒවා ප්‍රගුණ කළ යුතු ය.
- නායකයකු මෙන් ම අනුගාමිකයකු ලෙස වර්ධනය කරගත යුතු ගුණාංග ඇත.
- ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්ම සමාජයේ යහපැවැත්මට හේතු වේ.